ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර II විභාගය - 2022 ජූලි

## (202) අංකිත (ඩිජිටල්) පරිසරයේ තොරතුරු පද්ධති

(Information Systems in Digital Environment)

---

මෙම ප්‍රශ්න පත්‍රය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ නව වර්ධනයන් සහ ප්‍රවණතා පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වන අතරම තොරතුරු තාක්ෂණයේ සමස්ත අංගයන් පරීක්ෂා කරන ලදී. මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී තොරතුරු පද්ධති කෙරෙහි බලපෑමක් ඇති කරන සදාචාරාත්මක, සමාජීය සහ නීතිමය පරිසරය පිළිබඳ මනා දැනුමක් ද තිබීම වැදගත් වන බව සඳහන් කළ යුතුය.

මෙම ප්‍රශ්න පත්‍රය **A , B** සහ **C** ලෙස කොටස් තුනකින් සමන්විත විය. මෙම ප්‍රශ්න පත්‍රයේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම අවශ්‍ය විය.

### <u>A කොටස</u>

### ප්‍රශ්න අංක 01

තොරතුරු පද්ධති සහ ඩිජිටල් පරිසරය පිළිබඳ සමස්ත දැනුම මෙම ප්‍රශ්නයේ දී සරලව තේරුම්ගත හැකි ආකාරයෙන් පරීක්ෂා කර ඇත. සියලුම අපේක්ෂකයන් පාහේ මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට උත්සාහ කර තිබුණි.. ඔවුන්ගෙන් බහුතරයක් ඉහල මට්ටමක ලකුණු ලබා ගැනීමට සමත් වූහ.

මෙය ලකුණු 25 කට වාස්තවික ප්‍රශ්න 15 කින් සමන්විත විය. අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා දී ඇති උත්තර 4 අතුරින් වඩාත්ම සුදුසු පිළිතුර තෝරා ගැනීම අවශ්‍ය වේ. අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්න සඳහා දී ඇති එක් එක් ප්‍රකාශය සත්‍ය හෝ අසත්‍ය දැයි දැක්වීම අපේක්ෂා කරයි. මෙම ප්‍රශ්නයට වැඩි ලකුණු ලබා ගත් අපේක්ෂකයින් මෙම විෂය සඳහාද වැඩි ලකුණු ලබා ගත්හ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### <u>B කොටස</u>

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය වෘත්තීය විභාගයන් සඳහා විභාග පවත්වන අධ්‍යාපන ආයතනයක මූලික දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරයි. සියලුම අපේක්ෂකයන් මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණි.

**(a)** කොටස මගින් විභාග ක්‍රියාවලියකට අදාලව දත්ත ආදානය හා තොරතුරු ප්‍රතිදානය පරීක්ෂා කර ඇත. නමුත් සමහර අයදුම්කරුවන් වැරදීමකින් ලියාපදිංචි ක්‍රියාවලිය ලෙස තේරුම් ගෙන ලකුණු අහිමි කර ගෙන තිබුණි.

**(b)** කොටස මගින් තොරතුරු පද්ධති පුළුල් ලෙස භාවිත කිරීම සඳහා වන හේතු දෙකක් පැහැදිලි කිරීම පරීක්ෂා කර ඇති අතර ඒ සඳහා සාර්ථකව උත්තර ලියා තිබුණි.

**(c)** කොටස සඳහා සමහර අයදුම්කරුවන් තොරතුරු පද්ධතිය සහ තොරතුරු තාක්ෂණය අතර වෙනස හඳුනා ගැනීමට අපොහොසත් වී ඇති අතර ලකුණු දෙකක් අහිමි කර ගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක **03**

මෙම ප්‍රශ්නය සුපිරි වෙළෙඳසලක විවිධ භාවිතයන් සඳහා සුදුසු යෙදුම් මෘදුකාංග පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කර ඇත. සියලුම අපේක්ෂකයන් මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණි.

**(a) කොටස** මගින් දී ඇති අවස්ථාවන් සඳහා සුදුසු යෙදුම් මෘදුකාංග හදුනා ගැනීම අපේක්ෂා කරන අතර, **(b) කොටස** මගින් දත්ත පදනම් කළමනාකාරණ පද්ධතියක වාසි තුනක් සඳහන් කිරීම අපේක්ෂා කරයි.

බහුතරයක් අපේක්ෂකයන් **(a)** හා **(b) කොටස්** සඳහා නිවැරදිව උත්තර සපයා තිබුණි. නමුත්, පමණක් අයදුම්කරුවන් **(c) කොටස** වන වළාකුළු පරිගණකගතකරණය පිළිබඳ සළකා බැලීමේ දී දත්ත මධ්‍යස්ථාන මගින් සපයන අරමුණ පැහැදිලි කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කර්යසාධනය සාමාන්‍ය මට්ටමක තිබුණි.**

## ප්‍රශ්න අංක **04**

**(a) කොටස** හා **(b) කොටස** මගින් අයදුම්කරුවන්ගේ ව්‍යාපාර විශ්ලේෂණය හා ව්‍යාපාර බුද්ධිය පිළිබඳ අවබෝධය පරීක්ෂා කර ඇත. බහුතරයක් අපේක්ෂකයන් මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණි.

ඔවුන්ගෙන් කිහිප දෙනෙක් හැරෙන්නට ව්‍යාපාර විශ්ලේෂණය හා ව්‍යාපාර බුද්ධිය කෙසේ **XYZ සමාගමට** උපකාරී වන්නේද යන්න පැහැදිලි කර තිබුණි.

**(c) කොටස** මගින් දී ඇති ආයතනයට භාවිත කළ හැකි තොරතුරු පද්ධති දෙකක් හදුනා දැක්වීම අපේක්ෂා කළ අතර සියල්ලෝම පාහේ මෙම කොටසට මුළු ලකුණු ලබා ගත්හ.

මෙම විෂය පථයට සැලකිය යුතු කාලයක් යෙදවීම අයදුම්කරුවන්ගේ අනාගතයට වඩාත් ප්‍රයෝජන ලැබේ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණේය.**

## ප්‍රශ්න අංක **05**

ප්‍රශ්නයේ දී ඇති කොටස් තුන මගින් සමාජ මාධ්‍ය, ඒවායේ වාසි, අවාසි ආරක්ෂාකාරීව පරිහරණය කිරීම යනාදිය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී.

**(a)** හා **(b) කොටස්** සඳහා නිවැරදිව උත්තර ලියා තිබුනද සීමාකිරීම් මගහැරීමට ඇති හැකියාව උදාහරණ සහිතව **(c) කොටසට** සපයා නොතිබුණි.

බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට හොඳින් ලකුණු ලබා ගත්හ..

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයෙන් නවතම තාක්ෂණය හා විවිධ තාක්ෂණික ක්‍රම භාවිතයෙන් මූල්‍ය ගණුදෙනු කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී.

**(a) කොටස** මගින් ගුටකදාම හා බිට් කොයින් අතර වෙනස හඳුනා ගැනීම අපේක්ෂා කරන ලද අතර, අයදුම්කරුවන් සාර්ථකව මෙයට උත්තර සපයා නොතිබුණි.

ජංගම යෙදුම් ගැන අයදුම්කරුවන්ට පුළුල දැනුමක් තිබුනද, ක්ෂුද්‍ර ගෙවීම් පිළිබඳව හා ජංගම යෙදුම් වලට ඇති සම්බන්ධය පැහැදිලි කිරීමට අපොහොසත් වී ඇත. අයදුම්කරුවන් සුළුවෙන් ක්ෂුද්‍ර ගෙවීම් දි ඇති අවස්ථාවට යොදා ගත හැකි ආකාරය විස්තර කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.**

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය පදනම් වී ඇත්තේ සිද්ධි අධ්‍යයනයක් මත වන අතර , න්‍යාය අවබෝධ කර ගැනීම සහ ලබා දී අවස්ථාවට අදාළ වීම අපේක්ෂා කෙරේ. අපනයනයේ යෙදී සිටින සමාගමකට අනුගමනය කළ හැකි තාක්ෂණික උපාය මාර්ග හඳුනා ගැනීමේ හැකියාව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත.

සියලුම අපේක්ෂකයන් පාහේ මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණි. කෙසේ වෙතත් පමණක් අයදුම්කරුවන් නිවැරදිව **(c) කොටසට** උත්තර සපයා නොතිබුණි. **(a) කොටස** මගින් ගබඩා ඉඩකඩ සහ තොග කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා සමාගමට අනුගමනය කළ හැකි තොරතුරු තාක්ෂණ උපාය මාර්ගයක් සඳහන් කිරීම අපේක්ෂා කරන ලදී. නමුත් බොහොමයක් සාමාන්‍ය තොග පාලන ක්‍රම උත්තර ලෙස සපයා තිබුණි. මෙවැනි ප්‍රශ්න වලට උත්තර ලිවීමේදී ප්‍රායෝගිකව සිතා බැලීම ඉතා වැදගත් වේ.

ඒ අනුව**,** වෙබ් අඩවියක් සැකසීමෙන් ලබා ගත හැකි වාසි, පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු වඩා හොඳ පරිචයන්, උපාය මාර්ග සාක්ෂාත් කර ගැනීම සඳහා ආයෝජනය කිරීමට සිදුවිය හැකි තොරතුරු තාක්ෂණ යටිතල ව්‍යුහයේ සංරචක, සයිබර් ආරක්ෂාව වැඩි දියුණු කිරීමට ගත හැකි පියවර අයදුම්කරුවන් විසින් විස්තර කර තිබුණි.

මෙම විෂය නිර්දේශය යටතේ කලින් පවත්වන ලද විභාග වලට වඩා සිද්ධි අධ්‍යයන ප්‍රශ්නයට අදාලව අයදුම්කරුවන්ගේ කාර්ය සාධනය වර්ධනය වී ඇත. මේ සඳහා සරලව ප්‍රශ්න ඇසීමේ ආකාරය හා අපේක්ෂා කරන මූලික නිපුණතා මට්ටම ප්‍රධාන සාධකය විය හැක.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

- - - -

**<u>කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා ඉඟි:</u>**

**(1)** **සම්පූර්ණ විෂය නිර්දේශය හොඳින් අධ්‍යයනය කළ යුතුය.**

**(2)** **අපේක්ෂකයින් ප්‍රශ්නය හොඳින් කියවිය යුතු අතර ප්‍රශ්නයෙන් ඍජු පිළිතුරක් අපේක්ෂා කරන විට අනවශ්‍ය/අදාළ නොවන පැහැදිලි කිරීම් සහ විස්තර ලිවීම නොකළ යුතුය.**

**(3)** **තොරතුරු තාක්ෂණයට අදාළව අධ්‍යයන පෙළ, පොත්පත්, ලිපි, සඟරා සහ අනෙකුත් කියවීම් ද්‍රව්‍ය වෙත යොමු වන්න.**

**(4)** **පිළිතුරු ලිවීමේදී තොරතුරු තාක්ෂණයට අදාළ න්‍යායාත්මක සංකල්ප සහ ප්‍රායෝගික දැනුම සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය තැන්වල උදාහරණ උපුටා දැක්වීම වැදගත් වේ.**

**(5)** **අත් අකුරු කියවිය හැකි බවත් පිළිතුරු නිසි ලෙස අංකනය කර ඇති බවත් සහතික කර ගන්න.**

**(6)** **විභාග ප්‍රශ්න පත්‍රයේ දක්වා ඇති උපදෙස් පිළිපදින්න.**

**(7)** **ඔබේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා** පෙර **ප්‍රශ්න පත්‍ර / නියමු ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු අධ්‍යයනය කරන්න.**

**(8)** **ඵලදායී කාල කළමනාකරණයක් පුහුණු කරන්න.**

**(9)** **පිළිතුරු පත්‍ර ඉදිරිපත් කිරීමට පෙර පිළිතුරු නිසි ලෙස අංක කර ඇත්දැයි දෙවරක් පරීක්ෂා කරන්න.**

**(10)** **හොඳ සූදානමකින් සහ විභාගය සමත් වීමේ උපරිම බලාපොරොත්තුවෙන් විභාගයට මුහුණ දෙන්න.**

- * * * -